(ඉ) ආබාධිත දරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඔවුන්ට අවශ්‍ය ද්‍රව්‍යමය, මූල්‍යමය හා වෘත්තීමය ආධාර ලබා දීම;

(ඊ) හදිසි ආපදා අවස්ථාවලදී විපතට පත් ජනතාව වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම හා සහනාධාර ලබා දීම;

(උ) තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීම සහ ක්‍රීඩා කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම;

(ඌ) සියලුම ආගම් අතර සහජීවනය ඇති කිරීම අරමුණු කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(එ) වන වගා ව්‍යාපෘති ඇති කිරීම මඟින් පරිසර කළමනාකරණය හා පරිසර විනාශය අවම කර ගැනීම සඳහා දායකත්වය දැක්වීම;

(ඒ) ප්‍රදේශයේ ඇති පෞරාණික ස්ථාන ආරක්ෂා කිරීම සහ ඒවා අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීම අරමුණු කරගත් වැඩසටහන් සඳහා අනුග්‍රහය දැක්වීම සහ දායකත්වය ලබා දීම;

(ඔ) වැවිලි කර්මාන්තයේ නිරතව සිටින විවිධ ජාතීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සෘජුව හා වක්‍රව මැදිහත් වීම;

(ඕ) ගොවීන්ගේ වගා කටයුතු වැඩිදියුණු කිරීම, ගොවි ජනතාවගේ සමාජ සුභසිද්ධිය හා ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා නව දැනුම ලබා දීම සහ ඔවුන්ගේ දරුවන්ගේ සුභසාධන කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම;

(ක) ජනතාවගේ පාරම්පරික ආකල්ප, දේශීය වෛද්‍ය කලාව, සංස්කෘතික කටයුතු, අත්කම් නිර්මාණ වැඩිදියුණු කිරීම තුළින් ජාත්‍යන්තරය සමඟ සම්බන්ධවීමට අවශ්‍ය දැනුම, මගපෙන්වීම සඳහා සෘජුව මැදිහත්වීම;

(ග) පොදුව හා සාමූහිකව ගැටලුවකදී එහි සාධාරණත්වය මත නීතිමය අනුග්‍රහය දැක්වීම සහ නීති ආධාර ලබා දීමට කටයුතු කිරීම;

